# පාඨමාලා විස්තර සටහන 2026

## ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන




**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය**

*ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්*

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

*ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්*

# පාඨමාලා විස්තර සටහන 2026

## ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන

ශ්‍රී ලංකාව තුළත් ඉන් ඔබ්බටත්, සභාව තුළ මෙන්ම වැඩපොළේද, සේවයේ නිරතව සිටින ඇදහිලිවතුන්, ක්‍රිස්තු ගුණැති නායකයින් වන පිණිස, දේවධාර්මික අධ්‍යාපනයක් තුළින් සන්නද්ධ කිරීමට, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය කැපවී සිටී.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේදී, ඔබ විවිධ ක්‍රිස්තියානි නිකායන්වල ඇදහිලිවන්තයන් සමඟ එකට කටයුතු කරමින් ඉගෙන ගන්නා බැවින්, සියලු ක්‍රිස්තියානි සම්ප්‍රදායන් වල ඇති සාරවත්බව අත්දැකීමට ලැබෙන දේවධර්ම ශාස්ත්‍රාලයකි.

ක්‍රිස්තියානි එකමුතුකම කෙරෙහි කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කැපවීම මුල් බැස ඇත්තේ ශුද්ධ ලියවිල්ලේ අධිකාරිය මතය. අප එකමුතු වන්නේ, බයිබලය අපගේ ඇදහිල්ල සහ ජීවිතය සඳහා එකම මාර්ගෝපදේශය බවට ඇති හවුල් විශ්වාසය වටාය.

එන්න, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාපන ලබන්නන්ගේ විචිත්‍ර ප්‍රජාවට එකතු වී, අධ්‍යාපනය, ආත්මික වර්ධනය සහ දේව සේවය සඳහා ඵලදායී නිපුණතා වර්ධනය කර ගැනීම පෙරදැරි කරගත් ආකර්ෂණීය ගමනක් අරඹන්න!

**1971 අංක 32 දරන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ආඥා පනත මගින් සංස්ථාපිත**
**ආසියාතික දේවධර්ම සංගමයේ තෘතික අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් (ATA)**
**කොළඹ බයිබල් විද්‍යාලයේ එකම අංශයයි.**
**ශ්‍රී ලංකා ජාතික ධර්මදූත සන්ධානයේ හා (NCEASL)**
**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සාමාජික (NCCSL)**

# සන්නිවේදන තොරතුරු

| | |
|---|---|
| **ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන්** | **extensions@cts.lk** |
| **මාතර** | +94 77 2848513<br>matara@cts.lk |
| **මීගමුව** | +94 77 3952914<br>negombo@cts.lk |
| **අනුරාධපුර** | +94 77 3496852<br>dilip@cts.lk |
| **සහකාර සම්බන්ධීකාරක: ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන**<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු මහතා | einsteen@cts.lk |
| **ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන කළමනාකරු**<br>රාජාරාම් හරිහරන් මහතා | haran@cts.lk |
| **පීඨාධිපති**<br>දේවගැති රවින් කල්දේරා | ravin@cts.lk |

**+94 11 2890809 | www.cts.lk**

# පටුන


| | |
|---|---|
| | *පිටු අංකය* |
| **පොදු තොරතුරු** | **4** |
| **කාල සටහන්** | **6 – 11** |
| **පාඨමාලා විස්තරය** | **12 – 17** |
| **බහුස්ථානීය පාඨමාලා විස්තරය** | **17 – 18** |
| **කථිකාචාර්යවරුන්ගේ විස්තර** | **19 – 21** |
| **CTS පාඨමාලා විස්තර** | **22** |
| **ළමා සේවා ක්ෂේත්‍රය** | **23 – 24** |

# පොදු තොරතුරු

**CTS පාඨමාලා:**

- සාමාන්‍යයෙන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල එක් පාඨමාලාවක් මසකට එක් වතාවක් බැගින් දින 4 ක් පැවැත්වේ.

**පාඨමාලා දේශන පැවැත්වීම:**

- **පන්ති කාමරය තුළ:** පාඨමාලාව CTS ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවලදී ඉගැන්වේ.
- **බහුස්ථානීය පාඨමාලාව:** මෙම පාඨමාලාව CTS අධ්‍යයන මධ්‍යස්ථානවල උගන්වන අතර, තාක්ෂණය භාවිතයෙන් විවිධ අධ්‍යයන මධ්‍යස්ථානවල සිසුන්ටද අන්තර්ජාල අධ්‍යයන පන්ති කාමරයක් තුළ සිට සහභාගිවන්නට හැකියාව ලැබේ. පාඨමාලාව සතියකට වරක් පැවැත්වේ.

**CTS පාඨමාලා ගාස්තු:**

- එක් පාඨමාලාවක් සඳහා රුපියල් 3,500 ක් අය කෙරේ.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායී මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත්තේ සේවයේ මිතුරන්ගේ නොමසුරු මූල්‍ය පරිත්‍යාගශීලිත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

**පාඨමාලා සඳහා CTSහි ලියාපදිංචි වන ආකාරය:**

සන්නිවේදන තොරතුරු යටතේ ඇති CTS ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයන්හි සිටින කාර්ය මණ්ඩලය අමතා, පාඨමාලාවලට ලියාපදිංචි විය හැකිය.

# කාල සටහන්

# 2026

| | අනුරාධපුර | මාතර | මීගමුව |
|---|---|---|---|
| ජනවාරි - පෙබරවාරි | **ධර්මදූත සේවයට හැඳින්වීමක්**<br>ජනවාරි 20-23<br>දිලිප් ගුණවීර<br><br>**ශ්‍රාවකත්වය**<br>පෙබරවාරි 10-13<br>ලසිත් රාජකරුණා | **හිතෝපදේශ පොත**<br>ජනවාරි 13-16<br>නාමල් වීරසිංහ<br><br>**බයිබලීය අර්ථකථනය**<br>පෙබරවාරි 10-13<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | **එපීසවරුන්ට යැවූ හසුන**<br>ජනවාරි 20-23<br>බෙනිසි සිල්වා<br><br>**කිතුනු දැක්ම තුළ සන්නිවේදනය**<br>පෙබරවාරි 17-20<br>ක්‍රිස්නි එදිරිසිංහ |
| සතිපතා | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**කිතුනු දෙමාපියභාවය**<br><br>සිකුරාදා<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>සති 12<br>ආරම්භය: ජනවාරි 9<br><br>ක්‍රිස්නි එදිරිසිංහ | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**කිතුනු දෙමාපියභාවය**<br><br>සිකුරාදා<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>සති 12<br>ආරම්භය: ජනවාරි 9<br><br>ක්‍රිස්නි එදිරිසිංහ | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

| | අනුරාධපුර | මාතර | මීගමුව |
|---|---|---|---|
| මාර්තු - අප්‍රේල් | **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I**<br>මාර්තු 3-6<br>මධු මිහිරි ප්‍රනාන්දු<br><br>**බයිබලය අධ්‍යයන ක්‍රම**<br>අප්‍රේල් 7-10<br>දිලිප් ගුණවීර | **පැරණි ගිවිසුමට හැඳින්වීමක්**<br>මාර්තු 10-13<br>චමිලා සුභාෂ් රණසිංහ<br><br>**දේවධර්මයට හැඳින්වීම**<br>අප්‍රේල් 21-24<br>දිලිප් ගුණවීර | **උත්පත්ති පොත**<br>මාර්තු 17-20<br>බෙනිසි සිල්වා<br><br>**පොදු ගැටලු සඳහා උපදේශනය**<br>අප්‍රේල් 21-24<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු |
| සතිපතා | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**කිතුනු දෙමාපියභාවය**<br><br>සිකුරාදා<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>සති 12<br>ආරම්භය: ජනවාරි 9<br><br>ක්‍රිස්ති එදිරිසිංහ | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**කිතුනු දෙමාපියභාවය**<br><br>සිකුරාදා<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>සති 12<br>ආරම්භය: ජනවාරි 9<br><br>ක්‍රිස්ති එදිරිසිංහ | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

| | අනුරාධපුර | මාතර | මීගමුව |
|---|---|---|---|
| මැයි - ජූනි | **බිඳුණු උද්වේගයට සුවය**<br>මැයි 5-8<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු<br><br>**මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය**<br>ජූනි 2-5<br>බෙනිසි සිල්වා | **බහුත්ව සමාජයක ධර්මදූත සේවය**<br>මැයි 12-15<br>දුලිප් ප්‍රනාන්දු<br><br>**ශ්‍රාවකත්වය**<br>ජූනි 9-12<br>චමිලා සුභාෂ් රණසිංහ | **ශ්‍රාවකත්වය**<br>මැයි 19-22<br>චමිලා සුභාෂ් රණසිංහ<br><br>**බයිබලීය සාමසාධනය**<br>ජූනි 16-19<br>මහින්ද මුණසිංහ |
| සතිපතා | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**එපිසවරුන්ට යැවූ හසුන**<br><br>සිකුරාද<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>සති 13<br>ආරම්භය: මැයි 8<br><br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**එපිසවරුන්ට යැවූ හසුන**<br><br>සිකුරාද<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>සති 13<br>ආරම්භය: මැයි 8<br><br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

| | අනුරාධපුර | මාතර | මීගමුව |
|---|---|---|---|
| ජූලි - අගෝස්තු | **දේශනා ශිල්පය**<br>ජූලි 7-10<br>සනත් අතුකෝරාළ<br><br>**නව ගිවිසුමට හැඳින්වීමක්**<br>අගෝස්තු 4-7<br>නාමල් වීරසිංහ | **ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>ජූලි 14-17<br>මහින්ද මුණසිංහ<br><br>**ශුද්ධාත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>අගෝස්තු 11-14<br>දිලිප් ගුණවීර | **යෞවන යෞවනියන් සඳහා සේවය**<br>ජූලි 21-24<br>නාමල් වීරසිංහ<br><br>**ශුද්ධාත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>අගෝස්තු 18-21<br>දිලිප් ගුණවීර |
| සතිපතා | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**එපිසවරුන්ට යැවූ හසුන**<br><br>සිකුරාද<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>සති 13<br>ආරම්භය: මැයි 8<br><br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**එපිසවරුන්ට යැවූ හසුන**<br><br>සිකුරාද<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>සති 13<br>ආරම්භය: මැයි 8<br><br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

| | අනුරාධපුර | මාතර | මීගමුව |
|---|---|---|---|
| සැප්තැම්බර් - ඔක්තෝම්බර් | **පැරණි ගිවිසුමට හැඳින්වීමක්**<br>සැප්තැම්බර් 1-4<br>චමිලා සුභාෂ් රණසිංහ<br><br>**දේවධර්මයට හැඳින්වීම**<br>ඔක්තෝම්බර් 6-9<br>දිලිප් ගුණවීර | **නව ගිවිසුමේ පසුබිම**<br>සැප්තැම්බර් 8-11<br>මහින්ද මුණසිංහ<br><br>**නායකත්වය**<br>ඔක්තෝම්බර් 13-16<br>සරත් ද සිල්වා | **ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>සැප්තැම්බර් 15-18<br>සනත් අතුකෝරාළ<br><br>**යෙසායා**<br>ඔක්තෝම්බර් 20-23<br>මහින්ද මුණසිංහ |
| සතියතා | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**උපදේශනයට හැඳින්වීම**<br><br>සිකුරාද<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>සති 13<br>ආරම්භය: සැප්තැම්බර් 4<br><br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**උපදේශනයට හැඳින්වීම**<br><br>සිකුරාද<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>සති 13<br>ආරම්භය: සැප්තැම්බර් 4<br><br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

| | අනුරාධපුර | මාතර | මීගමුව |
|---|---|---|---|
| නොවැම්බර් - දෙසැම්බර් | **දෙවියන් වහන්සේ සහ ලෝකය**<br>නොවැම්බර් 3-6<br>මහින්ද මුණසිංහ<br><br>**බයිබලීය අර්ථකථනය**<br>දෙසැම්බර් 1-4<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | **දේශනා ශිල්පය**<br>නොවැම්බර් 10-13<br>සනත් අතුකෝරාළ<br><br>**උත්පත්ති පොත**<br>දෙසැම්බර් 1-4<br>බෙතිසි සිල්වා | **වෙනත් ආගම් අදහන්නන් සමඟ සබඳතා පැවැත්වීම**<br>නොවැම්බර් 17-20<br>චමිලා සුභාෂ් රණසිංහ<br><br>**ලිංගිකත්වය පිළිබඳ ආචාරධර්ම**<br>දෙසැම්බර් 1-4<br>ගයත්‍රි ද අල්විස් |
| සතිපතා | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**උපදේශනයට හැඳින්වීම**<br><br>සිකුරාදා<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>සති 13<br>ආරම්භය: සැප්තැම්බර් 4<br><br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | **බහුස්ථානීය පාඨමාලාව**<br><br>**උපදේශනයට හැඳින්වීම**<br><br>සිකුරාදා<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>සති 13<br>ආරම්භය: සැප්තැම්බර් 4<br><br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

# පාඨමාලා විස්තරය

## ධර්මදූත සේවයට හැඳින්වීමක් සම්මාන: 2

"දූතනය" සෑම කිතුනුවෙකුම අසා ඇති වචනයක් වුවද ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොපවතියි. මෙම පාඨමාලාව ඔබ දූතනයේ විවිධ පැතිකඩ තුළින් ගෙන යන අතර දෙවියන් වහන්සේගේ දූතනය තුළ ඔබටත්, සභාවටත් ඇති සුවිශේෂ කාර්යභාරය විවිධ මං ඔස්සේ අභියෝගාත්මක ලෙස ඉටුකිරීමට ඔබ සූදනම් කරයි.

## ශ්‍රාවකත්වය
## 21 වන සියවසේදී ජේසුස් වහන්සේගේ මාර්ගය අනුගමනය කරනුයේ කෙසේද? සම්මාන: 2

පළමු ශත වර්ෂය තුළ ශ්‍රාවකත්වය යන්නෙන් අදහස් වූයේ කුමක්දැයි ඉගෙන ගෙන එම ඉගැන්වීම් අද සමාජයේ අභියෝග ජයගැනීමට අදළ කරගැනීමට උපකාරී වේ. ව්‍යාපාරික ලෝකය තුළ, දේශපාලනය තුළ, දූත මෙහෙයන් තුළ ඇති ශ්‍රාවකත්වය පිළිබඳ විප්ලවකාරී ආකෘති හැදෑරීමක් ද සිදුවනු ඇත.

## හිතෝපදේශ පොත සම්මාන: 2

ජෝබ්, ධර්මදේශකයා සහ හිතෝපදේශ යන බයිබලීය පොත් පෞරාණික ඉශ්රායෙලයේ ප්‍රඥා සාහිත්‍ය සම්ප්‍රදය ආරක්ෂා කරයි. මුළු පොතෙහි ඇති අන්තර්ගතය ගැන ගැඹුරු අවබෝධයකින් කියවන විට හිතෝපදේශ පොතේ ඇති පාඩම් ඇගයීමට ද ජීවිතයට අදළ කර ගැනීමට ද හැකිවේ. ඉශ්රායෙල් ප්‍රඥාව තුළ ගිලෙන්න, ප්‍රඥාවන්ත ජීවිතයකට මඟ වූ හිතෝපදේශ පොත ඉගෙන ගන්න.

## බයිබලීය අර්ථකථනය සම්මාන: 2

බයිබලය සෑම පරම්පරාවක් උදෙසා වන දෙවියන් වහන්සේගේ නොවෙනස්වන වචනය බව කිතුනුවන්ගේ පිළිගැනීමයි. එහෙත් බයිබලය අර්ථකථනය කර එහි සත්‍ය නියමාකාරයෙන් උකහා ගැනීම අපට ඇති අභියෝගයයි. මෙම පාඨමාලාව තුළින් බයිබලයේ ඇති විවිධ සාහිත්‍ය පොත්: උද. කාව්‍යමය, කථාන්දර, අනාගත වාක්‍ය සහ ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමට ඇවැසි මූලධර්ම සපයයි.

## එපීසවරුන්ට යැවූ හසුන

සම්මාන: 2

එපීසවරුන්ට පාවුල් තුමා ලියූ හසුන "පාවුල් තුමාගේ පරමසාරය" ලෙස හඳුන්වනු ලබන්නේ සාරාංශයක් ලෙස ගත්කල එමඟින් ක්‍රිස්තුස් වහන්සේ ඔහුට භාරදුන් ශුභාරංචියේ හරය දැක්වෙන නිසාය. එපීස පොත දෙස කරන්නා වූ මෙම නැවුම් බැලීම තුළ ගැළවීම, සභාව හා කිතුනු ජීවිතය කෙරෙහි වූ ඔබේ දැක්ම පරිනාමනයකට ලක්වනු ඇත.

## කිතුනු දැක්ම තුළ සන්නිවේදනය

සම්මාන: 2

මිනිසා සමග සන්නිවේදනය කරන්නාවූ දෙවියන් වහන්සේ නමස්කාර කරන කිතුනුවන් වූ අපි සන්නිවේදන කලාවේ ඉදිරියෙන්ම සිටිය යුතු වෙමු. මිනිසා මුහුණ දෙන ප්‍රශ්න වලට මූලික හේතුවක් වනුයේ දුර්වල සන්නිවේදනයයි. ඔබගේ වෘත්තියේදී ඉවැන්ජලිස්ත සේවයේ දී පුද්ගලික ජීවිතයේ සියලු සම්බන්ධතාවයන්වලදී වැදගත් වූ සන්නිවේදනයේ කුසලතා වර්ධනය කර ගැනීමට මෙම පාඨමාලාව උපකාරී වේ.

## ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I

### ආරම්භයේ සිට ප්‍රතිසංස්කරණය දක්වා

සම්මාන: 2

ක්‍රිස්තියානි සභාව ආරම්භයේ පටන් ප්‍රතිසංස්කරණය දක්වා කාලය අතරතුර මිනිසුන්ගෙන්ද සිද්ධීන්ගෙන්ද දේවධර්මයන්ගෙන්ද පෝෂණය වී හැඩ ගැසී පැමිණ ඇත. සභාවේ මුල් වසර 1400 තුළ බිහි වූ ප්‍රාණපරිත්‍යාගිවරු, තපස්වරු, ධර්මදූතයෝ සහ ප්‍රගමන මෙම අධ්‍යයනයේ දී ඔබට මුණගැසෙනු ඇත.

## බයිබලය අධ්‍යයන ක්‍රම

සම්මාන: 2

ස්වයං-බයිබල් අධ්‍යයනයට මහෝපකාරී පාඨමාලාවකි. මෙම පාඨමාලාව තුළින් අධ්‍යාපනයට අදළ ප්‍රශ්න ඇසීමටත් ජීවිතයට අදළ කර ගැනීමටත් පුරුදු පුහුණු කරනු ඇත. බයිබලය අධ්‍යයනය කරන ක්‍රම හයක් සහ බයිබලය අධ්‍යයනයට ඇවැසි මෙවලම් ගැන උගනුමට මං පාදයි.

## පැරණි ගිවිසුමට හැඳින්වීමක්

සම්මාන: 2

පැරණි ගිවිසුමේ සෑම පොතක් පිළිබඳව එහි කතුවරයා අන්තර්ගතය, සැකිල්ල, ප්‍රධාන තේමා සහ ඓතිහාසික පසුබිම ආදී කරුණු පිළිබඳ සංක්ෂිප්ත දැක්මක් ලබාදෙයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් කියවන ලද බයිබලයේ ඇති විවිධ පොත් ඇගයීමට හා ඒවා රස විඳීමට හැකියාවක් ලැබෙන අතර පැරණි ගිවිසුම තේරුම් ගැනීමට මෙම පාඨමාලාව ඉමහත් රුකුලක් වනු ඇත.

## දේවධර්මයට හැඳින්වීම

සම්මාන: 2

අප අදහන දෙය ගැන පැහැදිලි දැනුමක් අපට තිබේද? අපගේ ඇදහිල්ල වෙනත් අයකුට පහදා දීමට ගොස් පැටලී නිරුත්තර වී තිබේද? දේවධර්මයට හැඳින්වීම විෂය ඉගෙනීමෙන් ඔබේ ඇදහිල්ල ඔබටම වඩා පැහැදිලි වන අතර අන් අයටත් ආත්ම විශ්වාසයෙන් යුක්තව පහදා දීමට හැකි මඟ පෑදීමක් කරයි.

## උත්පත්ති පොත

සම්මාන: 2

පටන් ගැන්ම පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකි. උත්පත්ති පොතෙහි සංස්කෘතික සහ ඓතිහාසික පසුබිම තුළ විචාරණාත්මක ඉගැන්වීමක් ගෙනේ. විශ්වයේද මිනිසාගේ ද ඉශ්රායෙල් ජනතාවගේද පාපය සහ ගැළවීමේද ආරම්භය ලියා ඇති පොත ලියැවී ඇති පසුබිම, එහි සැකැස්ම, තේමාවන් සහ පණිවිඩය විමර්ශනය කෙරේ.

## පොදු ගැටලු සඳහා උපදේශනය

සම්මාන: 2

දුක, ශෝකය, මානසික අසහනය, කාංසාව, හීනමානය, කේන්තිය, ඇබ්බැහිවීම් යනාදී දහසකුත් ප්‍රශ්නවලට සමාජය ගිලී ඇත. මෙම ප්‍රශ්න ක්‍රිස්තියානි පවුල්වලට ද බලපායි. මෙවැනි වාතාවරණයක ගිලී සිටින පිරිසට අත්වැලක් වීමට අවශ්‍ය නිපුණතාව ඔබට ලැබෙනු ඇත.

## බිඳුණු උද්වේගයට සුවය

සම්මාන: 2

මිනිසා උද්වේගයන්ගෙන් පිරී අයෙකි. ඒවා නිවැරදි ලෙස අනාවරණය නොකළහොත් පසු කලෙක දිවියට හානි පමුණුවන රෝගී තත්ත්වයක් බවට පත්වීමට ඉඩ ඇත. එම තත්ත්ව සැඟවුණු බැවින් හඳුනා ගැනීමට ඉතා අපහසුය. මානසික හා ආත්මික වර්ධනයට බාධා පමුණුවයි. එවැනි උද්වේග අවබෝධ කරගෙන කිතුනු දිවිය ගත කිරීමට මෙම පාඨමාලාව මහත් උපකාරයක් වනු නොඅනුමානය.

## බහුත්ව සමාජයක ධර්මදූත සේවය

සම්මාන: 2

ගැළවීමට එකම මාර්ගය යේසුස් ක්‍රිස්තුස් වහන්සේද? විකල්ප නොසලකා උඩඟු පණිවිඩයක් වෙනත් ආගම් ලබ්ධිකයින් හා වෙනත් ජීවන රටා අනුව ජීවත් වන අයට ප්‍රකාශ කළ හැකිද? මෙම පාඨමාලාව ශුභාරංචියේ හදවත වෙතට ඔබ කැඳවාගෙන යන අතර බහුත්වාදී සමාජයක යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අන් අයට හඳුන්වා දීම ඵලදායී ලෙස කිරීමට ඔබට මග පෙන්වයි.

## දෙවියන් වහන්සේ සහ ලෝකය

සම්මාන: 2

දෙවියන් වහන්සේගේ ස්වභාවය හා ගුණාංග, මවන ලද ලෝකය, මනුෂ්‍යත්වය හා පාපයට වැටීම, යන මූලික මාතෘකා වෙත අවධානය යොමු වේ. ක්‍රමික දේවධර්මය විෂය මාලාවේ පළමු අදියරයි. බයිබලීය පදනම මුල් කරගෙන, කිතුනු චින්තන ඉතිහාසයෙන් හා සමකාලීන සංවාදයන්ද ආශ්‍රිතව අධ්‍යයනය කරනු ලැබේ.

## බයිබලීය සාමසාධනය
සම්මාන: 2

පුද්ගලයින් අතර ගැටුම දෛනික සිද්ධියකි. එලෙසම ජාතික සහ අන්තර්ජාතික ගැටුම් කිතුනුවන්ගේ අවධානය ගනී. මේ සන්දර්භය තුළ යේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපට සාමය සඳහා මැදිහත් වන ලෙස පවසන සේක. බයිබලීය සාමය උදකිරීම කරනුයේ ගැටුමේ මූලාශ්‍ර සොයා යෑම, ගැටුම තේරුම් ගැනීම, විසඳීමට උචිත ප්‍රතිචාර දැක්වීම සහ සමාව දීම තුළිනි.

## දේශනා ශිල්පය
සම්මාන: 2

පොදු නමස්කාරයේ කේන්ද්‍රස්ථානයක් වනුයේ දේශනය යි. දේශනාවේ තිබිය යුතු ආවේගාත්ම බව ද වෙනසක් ඇති කරලීමේ හැකියාව ද සහිතව දේශනා කරන්නේ කෙසේද? දෙවියන් වහන්සේගේ වචනය බලවත් ලෙස සන්නිවේදනය කිරීමට ඇවැසි මූලික ලක්ෂණයක් වූ දේශනාව සැකසීම ද දේශනා කිරීමේ කලාව ද ඉගෙනීමට අපූරු අවස්ථාවකි.

## නව ගිවිසුමට හැඳින්වීමක්
සම්මාන: 2

නව ගිවිසුමේ පොත් තෝරා ගත් ආකාරය හා ඒවා පිළියෙල කළ ආකාරය ඉගෙන ගත හැකිය. නව ගිවිසුමේ සෑම පොතකම අඩංගු ප්‍රධාන පණිවිඩය හා එහි කර්තෘත්වය, නව ගිවිසුමේ පොත් සභාවට පළමු වතාවට ලැබුණු විට සිදුවුණු දේ පිළිබඳ ගවේෂණය කළ හැකිය. නව ගිවිසුම් සාහිත්‍ය පිළිබඳ පුළුල් අවබෝධයක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබේ.

## ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලත්වය සහ කාර්යය
සම්මාන: 2

ජේසුස් වහන්සේගේ දේවත්වය හා මනුෂ්‍යත්වය පිළිබඳ උන්වහන්සේගේ පුද්ගලත්වය විග්‍රහ කිරීමට කිතුනු ශාසනය තුළ විශේෂ කුතුහලයක් හා සියවස් ගණනාවක් පුරා පැවත එන සංවාදයක් ඇත. ජේසුස් වහන්සේ පැමිණියේ කුමක් ඉටු කිරීමටද? මිනිසාගේ ගැළවීමට උන්වහන්සේගේ මරණය හා උත්ථානය වැදගත් වන්නේ කෙසේද? මෙම පාඨමාලාව තුළ ක්‍රිස්තුවේදය සහ විමුක්තිවේදය ගවේෂණයට ලක් කරනු ඇත.

## ශුද්ධාත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය
සම්මාන: 2

පසුගිය සියවස තුළ අන් කවරදටත් වඩා ශුද්ධාත්මයාණන් පිළිබඳ කථාබහ සහ සාකච්ඡා පිළිබඳ මහත් උනන්දුවක් ඇතිවී ඇත. ඉතිහාසය පුරා ශුද්ධාත්මයාණන් පිළිබඳ දේවවේදය ගොඩනැගුණු ආකාරය ද ශුද්ධාත්මයාණන් පිළිබඳව බයිබලය පවසන දේ ද ඉගෙන ගැනීමට අවස්ථාවකි. සභාව තුළත් ඇදහිලිවන්තයන්ගේ ජීවිතය තුළත් ශුද්ධාත්මයාණන්ගේ සුවිශේෂී වූත් බලවත් වූත් ක්‍රියා පිළිබඳ දැනගැනීමට මහඟු අවස්ථාවකි.

## යෞවන යෞවනියන් සඳහා සේවය

සම්මාන: 2

දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ පැවරුම භූගෝලීය වශයෙන් පමණක් නොව පරම්පරාවෙන් පරම්පරාවටද ව්‍යාප්ත විය යුතුය. ගෝලීයකරණය වී ඇති ලෝකය තුළ තරුණ හඬ සහ ජීවය මිනිස් සමාජයේ ස්වභාවය උඩු යටිකුරු කරමින් පවතී. දේව රාජ්‍යය සඳහා වූ තාරුණ්‍යයේ ජීවය සභාව විසින් බොහෝ දුරට නොසලකා හැර ඇත. මෙම පාඨමාලාව යොවුන් වියේ ගැටලු, නව යොවුන් වියේ අභියෝග මෙන්ම අවුරුදු 14 සිට 21 දක්වා තරුණ තරුණියන් ශුභාරංචියට නතු කරගෙන ශ්‍රාවකත්වයට ගොඩනගන්නේ කෙසේද යන්න ගවේෂණය කරයි.

## නව ගිවිසුමේ පසුබිම

සම්මාන: 2

ක්‍රිස්තුස් වහන්සේ හා අපොස්තුළුවරුන්ගේ ලෝකය හැඩගැස්වූ සුවිශේෂී සිද්ධි හා ව්‍යාපාර පිළිබඳ අන්තර් දෘෂ්ටියක් මෙම පාඨමාලාව තුළින් ලැබේ. අන්තර් ගිවිසුම් යුගයේ ජුදෙව් ආගම, එහි වැදගත් ප්‍රගමනයන්, වැදගත් ලිපි ලේඛන ගැන මෙන්ම පලස්තීනයේ සහ රෝම ලෝකයේ සංස්කෘතිය ගැනද මෙහිදී විමසා බැලේ.

## නායකත්වය
### බයිබලයෙන් නායකත්වය ඉගෙනීම

සම්මාන: 2

නායකත්වය පිළිබඳ විවිධ අදහස්වලින් සමාජය පිරී ඇත. කිතුනුවන් වන අප බයිබලයට අනුකූල නායකත්ව ප්‍රතිපත්ති ඉගෙන ගන්නේ කෙලෙසද? මෙම පාඨමාලාව ඔබගේ සේවය තුළ, රැකියා ස්ථානය තුළ, නිවස තුළ ඵලදායි ලෙස නායකත්වය දීමට මග පාදනු ඇත.

## යෙසායා

සම්මාන: 2

අතිශයින් සිත්ගන්නා සුලු පාඨමාලාවක් වන මෙයින් යෙසායා පොතේ ඓතිහාසික පසුබිම, කර්තෘත්වය, තීරණාත්මක සංසිද්ධීන් සහ අන්තර්ගත පණිවිඩය වර්තමානයට අදාළ වන පරිදි අධ්‍යයනය කරනු ලැබේ. දෙවියන් වහන්සේ පිළිබඳ, පැමිණෙන්නට තිබෙන මෙසායා පිළිබඳ අනාගත වාක්‍යය සහ දේව රාජ්‍යයේ පරිසමාප්තිය පිළිබඳ ඉගෙන ගත හැකිය.

## වෙනත් ආගම් අදහන්නන් සමඟ සබඳතා පැවැත්වීම

සම්මාන: 2

ප්‍රධාන ආගම් තුනකින් යුත් සමාජයක බලපෑමක් සහිතව ජීවත්වීම සඳහා කිතුනුවන්ට මෙම ආගම් සහ ඔවුන්ගේ සුවිශේෂී සංස්කෘතික ලක්ෂණ ගැන ගැඹුරු අවබෝධයක් තිබීම වැදගත් වේ. බෞද්ධ, හින්දු, මුස්ලිම් ආගම්වල මූලික සිද්ධාන්ත ඉගෙනීමටත් ඔවුන් සමග ගෞරවනීය සංවාදයකට එළඹීමටත් ඉගෙන ගත හැකිය. සමාදන වූ ශ්‍රී ලංකාවක් තුළ ඔබගේ කාර්යභාරය කුමක්ද? එන්න පැමිණ ගවේෂණය කරන්න.

## ලිංගිකත්වය පිළිබඳ ආචාරධර්ම

සම්මාන: 2

මිනිස් ලිංගිකතාවට අදාළ ආචාරධර්මීය ගැටලු ගණනාවක් බයිබලීය දෘෂ්ටිකෝණයකින් මේ පාඨමාලාව තුළදී විමසා බැලේ. එහිදී ලිංගිකත්වය පිළිබඳ බයිබලීය දැක්ම සහ පුමිතිරි බව, ලිංගික අනුගත වීම, ලිංගික සීමා මායිම් ඇතුළු ඊට අදාළ මාතෘකා ගණනාවක් ගවේශනය කරනු ඇත්තේ කාම චිත්‍ර හා රචනා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කිතුනුවන්ට යහපත් ලිංගිකත්වය පිළිබඳ දෘෂ්ටියක් වර්ධනය කරගත හැක්කේ කෙසේද යන්න විමසා බලමින්ය.

## මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය

### බයිබලීය භාරකාරත්වය ඉගෙනීම

සම්මාන: 2

මුදල්, ඉතිරිකිරීම්, ආයෝජනය, ණය, දීම, 'සමෘද්ධිමත් ශුභාරංචිය', තපස්කම සහ ස්වර්ගීය විපාක යන මාතෘකාවන්ට අදාළ දේව වචනයේ පාඨ මෙම පාඨමාලාව තුළින් හදරනු ලැබේ. ඔබගේ ජීවිතයේ සදතනයටම බලපාන භාරකාරීත්වය පිළිබඳ බයිබලීය දැක්මක් ඇති කරලීම මෙහි අරමුණයි.

# බහුස්ථානීය පාඨමාලා

## කිතුනු දෙමාපියභාවය

බයිබලය තුළින් දෙමව්පියෙකු ලෙස දෙවියන් වහන්සේ දක්වන ආකාරයද ඇතිදැඩි කිරීම සම්බන්ධව එහි ඉගැන්වීම් ද මෙම පාඨමාලාවේදී සොයා බලනු ලැබේ. පෝෂණය, ආරක්ෂාව, විනය, උපදෙස් යනාදිය දරුවෙකුගේ වර්ධනයේ සෑම අවධියකදීම දෙමාපිය ආදරය තුළ තිබිය යුතුය. වඩා හොඳ දෙමාපියන් වීමට ඔබටත් ඒ සඳහා අන්‍යයන්ට මග පෙන්වීමටත් මේ පාඨමාලාව හැදෑරීම තුළින් හැකියාව ලැබේ.

BTh|Dip වෛකල්පික

සති 12

දිනය: සිකුරාද

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

## එපීසවරුන්ට යැවූ හසුන

එපීසවරුන්ට පාවුල් තුමා ලියු හසුන "පාවුල් තුමාගේ පරමසාරය" ලෙස හඳුන්වනු ලබන්නේ සාරාංශයක් ලෙස ගත්කල එමඟින් ක්‍රිස්තුස් වහන්සේ ඔහුට භාරදුන් ශුභාරංචියේ හරය දැක්වෙන නිසාය. එපීස පොත දෙස කරන්නා වූ මෙම නැවුම් බැලීම තුළ ගැළවීම, සභාව හා කිතුනු ජීවිතය කෙරෙහි වූ ඔබේ දැක්ම පරිනාමනයකට ලක්වනු ඇත.

BTh|Dip වෛකල්පික

සති 13

දිනය: සිකුරාද

වේලාව: පෙ.ව.9:00-11:20

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

# බහුස්ථානීය පාඨමාලා


| | |
|---|---|
| **උපදේශනයට හැඳින්වීම**<br>මානසික සහ චිත්තවේගී සහනය අවශ්‍යව සිටින්නාවූ පුද්ගලයන් අපට දෛනික ජීවිතයේදී මුණ ගැසේ. ඔවුන්ට උපකාර කරන පුද්ගලයෙකු ලෙස කිතුනුවෙකු සවිගත වන්නේ කෙසේද? උපදේශනය පිළිබඳ බයිබලීය ඉගැන්වීම් හැදෑරීම, අන් අයට උපකාර කිරීම සහ ඔවුන් පූර්ණත්වයට පත්කිරීමට අවශ්‍ය මූලික කුසලතා සම්බන්ධයෙන් හැඳින්වීමක් සිදු කෙරේ. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 13<br>දිනය: සිකුරාද<br>වේලාව: පෙ.ව.9:00-11:20<br>ආරම්භය: සැප්තැම්බර් 4<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු** |

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**දිලිප් ගුණවීර,** BTh, MSW

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උතුරු මැද ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරකවරයාය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදී උපාධියද, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ (NISD) සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. වසර 13 ක කාලයක් කල්වාරි දේවස්ථානයේ සභාපාලක සේවයේ අත්දැකීම් ඇත. වර්තමානයේ අනුරාධපුර ලංකා දේව සභාවේ ගිහි දේශකයෙකු සහ නායකයෙකු ලෙස ද සේවය කරන්නේය.



**ලසිත් රාජකරුණා,** BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) බයිබලීය අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. යෞවන කිතුමඟ සංවිධානයේ ස්වේච්ඡා නායකයෙකු ලෙස අවුරුදු 16ක්ද, පූර්ණකාලීන සේවකයෙකු ලෙස අවුරුදු 3ක් ද සේවය කර ඇත. මහනුවර බැප්ටිස්ට් සභාවේ ක්‍රියාශීලී සාමාජිකයෙක්ද, ඩීකන් මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද ක්‍රියා කර ඇත.



**ඊන්ස්ටීන් ප්‍රනාන්දු,** HND (Counselling), BTh, PgDip (BAPC), MSW (candidate)

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සහකාර සම්බන්ධීකාරක: ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. කිතුසෙවණ සේවයේ දේවගැතිවරයෙකු ලෙස ද ගෝලත්ව මධ්‍යස්ථානයේ ගුරුවරයෙක් හා උප විදුහල්පතිවරයෙක් ලෙස ද කටයුතු කර තිබේ. උපදේශන කටයුතුවල නිරත වන අතර ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව ලබාගත්තේය.



**නාමල් වීරසිංහ,** BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමඟ සංවිධානයේ හි (YFC) වසර 24ක පූර්ණකාලීන සේවයේ නියැලි සිටින එතුමන් වර්තමානයේ තාරුණ්‍යය දිරිගැන්වීමේ සේවය භාරව කටයුතු කරනු ලබයි. උපදේශන කටයුතුවල නිරත වන අතර ඒ පිළිබඳ වැඩිදුර හදරයි. එතුමන් ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයකු ලෙසද කටයුතු කරයි.



**බෙනිසි සිල්වා,** BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදි උපාධියද, පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) දේවධර්මය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. දැනට කිතුනු ධර්මය ඉගැන්වීමේ හා පුහුණුකිරීමේ සේවයේ යෙදී සිටින අතර, අවුරුදු 10ක පමණ තරුණ සේවයේ නායකත්වයද අවුරුදු 24ක පමණ සභාවේ දේවගැති සේවයේද අත්දැකීම් ලද්දෙකි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර




**ක්‍රිස්නි එදිරිසිංහ,** BTh
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය.**
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. විසිවසරකට ආසන්නව ඉරුදින පාසල් හා පෙරපාසල් ගුරුවරියක් වශයෙන්ද අනතුරුව “ශ්‍රී ලංකා ළමා ධර්මදූත සහභාගිත්වයේ” (CEF) මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙසද සේවයකර ඇත.



**මධු මිහිරි ප්‍රනාන්දු,** Dip MME, BA, MA
කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණියකි. වසර විසි දෙකක් කොළඹ බිෂොප් විදුහලේ ගුරුවරියක් ලෙස සේවය කළ අතර උපදේශකවරියක් ලෙසද කටයුතු කරයි. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය නාලිකා හි වැඩසටහන් මෙහෙය වන්නියක් වන අතර කිතුනු ගුරු පුහුණු උපදේශකවරියක් ලෙසද සේවය කරයි. ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.



**චමිලා සුභාෂ් රණසිංහ,** HND (Counselling), BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. වසර 8ක කාලයක් සභාපාලිකාවක් ලෙස සේවයේ නිරතව සිටි අතර, පසුව ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමණාකාරිනිය වශයෙන්ද කටයුතු කරන ලදි. රූපවාහිනි සහ ගුවන්විදුලි කිතුනු වැඩසටහන් නිෂ්පාදිකාවක් සහ නිවේදිකාවක් වන අතර කිතුනු ලිපි හා පොත්පත් ලේඛිකාවක්ද වෙයි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශනය පිළිබද ජාතික ඩිප්ලෝමාව ද (NDC) උසස් ජාතික ඩිප්ලෝමාව ද (HND) ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.



**දූලිප් ප්‍රනාන්දු,** BSc (Eng), BD, ThM
විශ්‍රාමික මෙතෝදිස්ත දේවගැතිවරයෙකි. මෙතුමා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේද ලන්ඩන් දේවධර්ම විද්‍යාලයේද (එක්සත් රාජධානිය) ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේද (ඇමරිකාව) උපාධිධාරියෙකි. ඉංජිනේරු පසුබිමක් සහිත මෙතුමා කටුබැද්ද උසස් තාක්ෂණික විද්‍යාලයේද පසුව මොරටුව විශ්ව විද්‍යාලයේද දේශකයකු ලෙස කටයුතු කර ඇත. එතුමා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සභාපතිවරයෙකු ලෙසද කටයුතු කර ඇත.



**මහින්ද මුණසිංහ,** BTh, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර කැම්පස් කෘසේඩ් ෆොර් ක්‍රයිස්ට් සහ නැවිගේටර්ස් ආයතනයන් හි දිගු කලක් සේවය කර ඇත. පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) පරිවර්තනාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි නායකයෙක් සහ පූර්ණ ගිහි දේශකයෙක් ලෙස සේවය කරන අතර වර්තමානයේ ගෝලයන් ගොඩනැගීමේ සේවාවේ නියුක්තව සිටී.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**සනත් අතුකෝරාළ,** BSc, BTh, MA (Hons), PhD
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ශිෂ්‍ය කටයුතු සම්බන්ධිකාරකවරයාය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරයෙකු වන මෙතුමා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යාව පිළිබඳ උපාධියද, ටෝච් ට්‍රිනිටි විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2007) සහ අධ්‍යාපන අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධිය (2020) ද ලබා ඇත. වසර 20 කටත් වැඩි දේව සේවයේ හා ඉගැන්වීමේ සේවයේ පළපුරුද්දක් ඇති අතර මෙතුමා සියලු ජාතීන්ගේ සභාවේ සාමාජිකයෙකි.



**සරත් ද සිල්වා,** BTh, MDiv
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදි උපාධියද, පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. වසර 30කට අධික කාලයක් පුරා විවිධ සේවා කෙෂ්ත්‍රවල පුළුල් අත්දැකීම් ඇති, වර්තමානයේ ඌව, නැගෙනහිර හා බස්නාහිර යන පළාත්හි බොහෝ පුරෝගාමි සේවකයින්ගේ මිත්‍රෝපදේශයෙකු (Mentor) ලෙස කටයුතු කරයි. තවද පීඩා විඳින සභාවන් වෙනුවෙන් සේවය කරන නිව් හාර්වෙස්ට් ෆවුන්ඩේෂන් ආයතනයේ ජාතික අධ්‍යක්ෂක වශයෙන් ද කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**ගයත්‍රි ද අල්විස්,** BTh, PgDip, MA (candidate)
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උසස් ජාතික උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවද උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවද ලබා ඇත. කොළඹ විශ්ව විද්‍යාලයෙන් ළමා ආරක්ෂණය සහ අයිතිවාසිකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇති ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේ කටයුතුවල නියැලෙන්නීය. ඇය සුදුසුකම් ලත් උපදේශිකාවක් සහ අභිප්‍රේරණ කථිකයෙකි. නාරාහේන්පිට ජනතා දේව සභාවෙහි සාමාජිකාවකි.

# CTS පාඨමාලා විස්තර

ශිෂ්‍යයන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා හැදෑරීම සඳහා සාදරයෙන් පිළිගන්නා අතර අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අප ඔබ දිරිමත් කරන්නේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඔබට ලබාගත හැකි උපරිමය අත්කරගනු සඳහාය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පෙළ දෙකක අධ්‍යාපනයක් පිරිනමයි. ඒ සියල්ල ම ආසියානු දේවවේදී සංගමය (ATA) විසින් පිළිගනු ලැබූ ඒවා වේ. ඔබට වඩාත් ගැළපෙන්නේ කුමන පාඨමාලාවදැයි කියවා අනාවරණය කරගන්න.

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය (CCS)**
21 වැනි සියවසේ ජීවිතය, රැකියාව හා සේවය වෙනුවෙන් (ගිහි) කිතුනුවන් සවිගැන්වීම පිණිස මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*

**දේවධර්ම ඩිප්ලෝමා (DipTh)**
කිතුනු සේවකයන් සඳහා ගැඹුරු බයිබලීය අන්තර් දෘෂ්ටියක් හා සේවය සඳහා නිපුණත්වයක් ලබාදීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 72කි*

***වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:***
අධ්‍යයන කාර්යාලය
011 2890809; extensions@cts.lk

# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
# ළමා සේවා ක්ෂේත්‍රය

**පාඨමාලාව:**

- පාඨමාලාවක් සාමාන්‍යයෙන් සතියකට දෙවරක් පැය 3ක කාලයක් පැවැත්වේ.
    - සෑම සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනකම ප.ව.6:00-9:00 දක්වා
- සෑම විෂයක් සඳහා සම්මාන පැය දෙකකි.
- වසර 2කින් ශිෂ්‍යයා හට මෙම විෂයමාලාව නිම කළ හැකිවන අයුරින් සැලසුම් කර ඇත.

| | විෂයන් | සම්මාන |
|---|---|---|
| අනිවාර්ය<br>බයිබලය සහ දේවධර්ම විෂයන්<br>ළමා සේවා විෂයන් | <br>04<br>04 | <br>08<br>08 |
| වෛකල්පික විෂයන් | 10 | 20 |
| සම්මන්ත්‍රණ | 04 | 00 |
| එකතුව | 22 | 36 |

සැ.යු.: සහතික පත්‍රය ලබාගැනීමට ඉහත සියලු විෂයන් සම්පූර්ණ කළ යුතු වේ.

**පාඨමාලා දේශන පැවැත්වීම:**

- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom තාක්ෂණය හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle පහසුකම තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.

**සන්නිවේදන තොරතුරු:**

ක්‍රිස්නි එදිරිසිංහ මිය
සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය
දුරකථන අංකය: +94 764823127
විද්‍යුත් තැපැල්: cm@cts.lk

# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
# ළමා සේවා ක්ෂේත්‍රය

**<u>අනිවාර්ය: බයිබලය සහ දේවධර්ම විෂයන්</u>**

දරු දැරියන් පිළිබඳව බයිබලීය දැක්ම
දේවධර්මයට හැඳින්වීම
නව ගිවිසුමට හැඳින්වීමක්
ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම

**<u>අනිවාර්ය: ළමා සේවා විෂයන්</u>**

සාකල්‍ය ළමා සංවර්ධනය
දරු දැරියන්ට බයිබලය ඉගැන්වීම
ළමා සේවයේ ආචාරධර්ම
ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය

**<u>වෛකල්පික විෂයන්</u>**

අපයෝජනයට ලක් වූ දරුවන් වෙත සේවය
කිතුනු දැක්ම තුළ සන්නිවේදනය
අවදානම් සහිත දරුවන් කෙරෙහි සභාවේ භූමිකාව
ඔබ තුළ ඇති නායකත්වය වර්ධනය කිරීම
රැකවරණය සලසන්නාගේ ආත්මික හැඩගැස්ම සහ ආතතිය කළමනාකරණය
සංස්කෘතිය අවබෝධ කරගැනීම
කිතුනු දෙමාපියභාවය
යෞවන යෞවනියන් සඳහා සේවය
ළමා උපදේශනය
දරු දැරියන් සඳහා ශ්‍රාවකත්වය

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත විෂයන්වල වෙනස්කම් සිදුවිය හැකිය.*

189 දුටුගැමුණු වීදිය, කොහුවල
(+94) 11 2890809 | student.services@cts.lk | www.cts.lk